**මහියංගනය ජල සම්පාදනය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය - 2014**

---

මහියංගනය ජල සම්පාදනය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියේ 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා යුනි ක්‍රෙඩිට් බැන්ක් ඔස්ට්‍රියා ඒ ජී අතර 2013 මාර්තු 14 දින එළඹි අංක 231.269 දරන අපනයන ණය පහසුකම් ගිවිසුම යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ අපනයන ණය පහසුකම් ගිවිසුම අනුව, එවකට ජල සම්පාදන හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය, වර්තමානයේ නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මහියංගනය හා රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල පොදු ජල සම්පාදන පහසුකම්, සැලසුම් කිරීම, ඉදිකිරීම හා ව්‍යාප්ත කිරීම මඟින් 33,301 ක් පමණ වන ග්‍රාමීය ජනතාවට ආරක්ෂිත පානීය ජලය ලබාදීම හා එමඟින් ප්‍රදේශයේ ජනතාවගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම හා දිළිඳුකම අඩුකිරීම සඳහා දායකවීමයි. අපනයන ණය පහසුකම් ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 2,743.56 කට සමාන යූරෝ මිලියන 16.72 ක් වේ. ඉන් රු.මිලියන 1,707.56 කට සමාන යූරෝ මිලියන 10.40 ක් හෙවත් සියයට 62.24 ක් සැපයීමට යුනි ක්‍රෙඩිට් බැන්ක් ඔස්ට්‍රියා ඒජී විසින් එකඟ වී තිබුණු අතර රු.මිලියන 1,036.00 කට සමාන යූරෝ මිලියන 6.32 ක් හෙවත් සියයට 37.76 ක් සැපයීමට ශ්‍රී ලංකා රජය විසින් එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 මැයි 22 දින ආරම්භ කරන ලද අතර 2015 මැයි 07 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම් ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් අපනයන ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව. සහ

(ඌ) අපනයන ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව

**1.5 තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනම**

-------------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**2.1 මතය**

---------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් උද්ගත වන ගැලපීම් වලින් ඇතිවන බලපෑම් හැරුණු විට, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා

සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව, සහ

(ඇ) අපනයන ණය පහසුකම් ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

ව්‍යාපෘතිය විසින් ප්‍රසම්පාදනය කරන ලද රු.මිලියන 1.12 ක් වටිනා ස්ථාවර වත්කම් වෙනම දක්වනු වෙනුවට කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2014 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය පහත දැක්වේ.

| ප්‍රභවය | අපනයන ණය පහසුකම් ගිවිසුමේ මූල්‍යායනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් 2014 වර්ෂය තුළ | | උපයෝජනය කළ අරමුදල් 2014 දෙසැම්බර් 31 දක්වා | |
|---|---|---|---|---|---|---|---|
| | යුරෝ මිලියන | රු.මිලියන | රු.මිලියන | යුරෝ මිලියන | රු.මිලියන | යුරෝ මිලියන | රු.මිලියන |
| යුනික්‍රෙඩිට් බැන්ක් | 10.40 | 1,707.56 | 200.00 | 3.33 | 584.18 | 5.41 | 922.30 |
| ශ්‍රී ලං ර | 6.32 | 1,036.00 | 100.00 | 0.51 | 80.00 | 0.61 | 99.10 |
| එකතුව | 16.72 | 2,743.56 | 300.00 | 3.84 | 664.18 | 6.02 | 1,021.40 |

වෙන් කරන ලද සම්පත් යොදා ගනිමින්, ව්‍යාපෘතියේ අරමුණු ඉටු කර ගැනීම තහවුරු කර ගැනීම සඳහා, සමස්ත ව්‍යාපෘති කාල පරිච්ඡේදය ආවරණය වන පරිදි මාසික, කාර්තුමය හා අර්ධ වාර්ෂික ආදි වශයෙන් වගකීම් පැවරෙන පරිදි මූල්‍ය හා භෞතික ඉලක්ක මතු කර දක්වමින් පරිපූර්ණ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතුය. භෞතික ඉලක්ක ආවරණය කරමින් ව්‍යාපෘතිය විසින් විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර තිබුණද, බැහැරවීම් හඳුනාගැනීම සඳහා හා අවශ්‍ය ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග ගැනීම සඳහා යාන්ත්‍රණයක් හඳුන්වා දී නොතිබුණි.

## 3.2 භෞතික ප්‍රගතිය

------------------

ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තා අනුව, ව්‍යාපෘති කාර්යයන් පිළිබඳව සමාලෝචිත වර්ෂය අවසානයට සමස්ත භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 55.95 ක් හා සියයට 39.1 ක් විය. ව්‍යාපෘති කාලපරිච්ඡේදය 2015 මැයි 07 වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබූ හෙයින් ව්‍යාපෘතිය විසින් කඩිනම් ක්‍රියාමාර්ග නොගතහොත්, ව්‍යාපෘතියේ ඉතිරි කාලපරිච්ඡේදය තුළ ව්‍යාපෘති කාර්යයන් අවසන් කිරීම සැකසහිතව පවතී.

## 3.3 පරිබාහිර ගනුදෙනු

---------------------

ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා අදාළ නොවන ජාත්‍යන්තර සම්මේලනයක් සඳහා දායක වීමට ව්‍යාපෘතිය විසින් රු.මිලියන 1.12 ක මුදලක් වැයකර තිබූ බව නිරීක්ෂණය විය.

## 3.4 මූල්‍ය පාලන පිළිබඳ ගැටලු

----------------------------

මුදල් රෙගුලාසි 134(3) හා 2010 ජූලි 26 දිනැති අංක 5 දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛය ප්‍රකාරව, ව්‍යාපෘතියේ කාර්යයන් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශයේ විගණනය සඳහා භාජනය කර නොතිබුණි.

## 3.5 මතභේදයට තුඩු දෙන කරුණු

-------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අපනයන ණය පහසුකම් ගිවිසුම යටතේ කරන ලද මූල්‍ය සැලසුම්වලට අදාළව ශ්‍රී ලංකා රජය සමඟ අතිරේක ණය ගිවිසුමකට එළඹීම සඳහා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) ව්‍යාපෘතිය විසින් එහි පරිපාලන කටයුතු සඳහා ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් බඳවා ගෙන තිබුණද, පරිවයක් වශයෙන් ව්‍යාපෘතියේ කාර්ය මණ්ඩලය සඳහා පාරිශ්‍රමික ගණනය කිරීම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් සිදු කර තිබූ අතර ඒ සඳහා සියයට 20 ක පොදු කාර්ය පිරිවැය ව්‍යාපෘතියෙන් අයකර ගෙන තිබුණි.